පුරප්පාඩු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

(1) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් (HM-1-1)

ඵලදායී වෘත්තීය ප්‍රගමනය

මානව සම්පත් හා පරිපාලන අංශ ප්‍රධානී වන අතර, මානව සම්පත් හා පරිපාලනය පිළිබඳ සියලුම කටයුතු සම්බන්ධයෙන් සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ මානව සම්පත් හා පරිපාලන අංශයට නායකත්වය දිය හැකි උසස් හැකියාවන් සහිත ප්‍රතිඵල වලට නැඹුරු අයෙකු විය යුතුය.

සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත්/ කළමනාකරණය / පරිපාලනය පිළිබඳ ඉහළ පෙළ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් **හෝ**
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත් / පරිපාලනය පිළිබඳ විශේෂ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් **හෝ**
(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත්, මානව සම්පත් / පරිපාලන/ නීතිය යන විෂය ඇතුළුව ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් **සහ**
ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක මානව සම්පත්/ කළමනාකරණය / පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (Masters) සුදුසුකම් **සහ**
ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, මානව සම්පත් / පරිපාලනය විෂය ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

(2) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ත්ව පාලන (HM-1-1)

ඵලදායී වෘත්තීය ප්‍රගමනය

තත්ත්ව පාලන අංශ ප්‍රධානී වන අතර, තත්ත්ව පාලනය පිළිබඳ සියලුම කටයුතු සම්බන්ධයෙන් සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ තත්ත්ව පාලන අංශයට නායකත්වය දිය හැකි උසස් හැකියාවන් සහිත ප්‍රතිඵලවලට නැඹුරු අයෙකු විය යුතුය.

සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව ඇතුළුව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**
(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව ඇතුළුව ලබාගත්, විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම **සහ**
ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත්, විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **හෝ**
(ii) රසායන විද්‍යායතනයේ ආයතනික සාමාජිකත්වය **සහ**
ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ/ ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

(3) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන (HM 1-1)

ඵලදායී වෘත්තීය ප්‍රගමනය

වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශ ප්‍රධානියා වන අතර, වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ සියලුම කටයුතු සම්බන්ධයෙන් සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශ වලට නායකත්වය දිය හැකි උසස් හැකියාවන් සහිත ප්‍රතිඵලවලට නැඹුරු අයෙකු විය යුතුය.

සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව ඇතුළුව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**
(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව ඇතුළුව ලබාගත්, විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම **සහ**
ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත්, විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **හෝ**
(ii) රසායන විද්‍යායතනයේ ආයතනික සාමාජිකත්වය **සහ**
ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ/ ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

(4) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි (HM 1-1)

ඵලදායී වෘත්තීය ප්‍රගමනය

අලෙවි අංශ ප්‍රධානී වන අතර, අලෙවි කටයුතු සම්බන්ධයෙන් සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ අලෙවි අංශයට නායකත්වය දිය හැකි උසස් හැකියාවන් සහිත ප්‍රතිඵලවලට නැඹුරු අයෙකු විය යුතුය.

සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් අලෙවිකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම **සහ**
ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් අලෙවිකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ක්ෂේත්‍රයට අදාළ වන පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **සහ**
ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, අලෙවිකරණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

තනතුරු (1) සිට (4) සඳහා සුදුසුකම් - අභ්‍යන්තර අපේක්ෂකයින්

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකාර සේවා ශ්‍රේණියේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

තනතුරු (1) සිට (4) දක්වා පොදු කරුණු

- **වැටුප් පරිමාණය**
  MM 1-1 – 2016 රු. 80,295/- 15 x 2,270/- 114,345/=
- **වයස**
  අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවාගැනීමේ ක්‍රමය**
  ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

තනතුරු (1) සිට (4) සඳහා අනෙකුත් ප්‍රතිලාභ

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

(5) කළමනාකරු - සැළසුම් හා ප්‍රසම්පාදන (MM 1-1 - II ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී / වාණිජ ක්ෂේත්‍රයේ උපාධියක් **හෝ**
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් වෙනත් සමාන උපාධියක් **සහ**
ආ) පරිගණක සාක්ෂරතාවය **සහ**
රාජ්‍ය / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ ප්‍රසිද්ධ වාණිජ ආයතනයක, සැලසුම් හා ප්‍රසම්පාදන, දේශීය / විදේශීය ප්‍රසම්පාදන කටයුතු / මිලදී ගැනීම් ක්ෂේත්‍රවල , සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද.

සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්

(01) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් ලබා තිබීම **හෝ**
(02) තනතුරට අදාළව, විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරණ වර්ගීකරණයේ (JM 1-1) අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම

තනතුරට අදාළ පොදු කරුණු

- **වැටුප් පරිමාණය**
  MM 1-1 – 2016 රුපියල් 53,175/- 10X 1,375/- 15 X1,010/- 95,375/-
- **වයස**
  අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමය**
  ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

(6) ඖෂධ තාක්ෂණවේදී - නිෂ්පාදන (JM 1-1 - II ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ඖෂධවේදී, ස්වාභාවික විද්‍යා හෝ ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකම් **සහ**
ආ) පරිගණක සාක්ෂරතාවය **සහ**
ඇ) සුදුසුකම් ලැබීමෙන් පසු ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසර එකක පළපුරුද්ද

සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්

(01) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් ලබා තිබීම **හෝ**
(02) තනතුරට අදාළව එම විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

තනතුරට අදාළ පොදු කරුණු

- **වැටුප් පරිමාණය**
  JM 1-1 -2016 - රු .42,600/= 10,755 – 18x1,135 – 70,580/=
- **වයස**
  අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමය**
  ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

(07) ගබඩා භාරකරු (MA 2-1 - III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, එක් වරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම. **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) (නව විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවේ විෂයයන් 02 ක් සමත් වීම **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවේ විෂයයන් 02 ක් සමත් වීම **සහ**
(ආ) පරිගණක සාක්ෂරතාවය **සහ**
(ඇ) රජයේ සංස්ථාවක /මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වාණිජ ආයතනයක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද **සහ**
(ඈ) වෘත්තීමය
NVQ සුදුසුකම් 5 තලයට නොඅඩු මිලදී ගැනීම් හෝ තොග කළමනාකරණ ඩිප්ලෝමාවක්

(08) සැලසුම් හා ප්‍රසම්පාදන සහකාර(MA 2-1 - III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික සුදුසුකම්
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, සිංහල/ දෙමළ, විද්‍යා, ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් ඇතුළත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් එක්වරකදී සමත්ව සිටීම **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන්, (නව විෂය නිර්දේශයෙන්) (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් 02කින් සමත්ව සිටීම **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන්, (පැරණි විෂය නිර්දේශයෙන්) විෂයයන් 02කින් සමත්ව සිටීම **සහ**
(iii) පරිගණක සාක්ෂරතාවය **සහ**
(ආ) වෘත්තිමය සුදුසුකම්
මිලදී ගැනීම් /තොග කළමනාකරණය පිළිබඳ NVQ-5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(09) තාක්ෂණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන (MA 2-1-III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, එක්වරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) (නව විෂය නිර්දේශය) රසායන විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 2ක් සහිතව විද්‍යා විෂය ධාරාවේ විෂයයන් 03 ක් සමත් වීම **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) රසායන විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 2ක් සහිතව විද්‍යා විෂය ධාරාවේ විෂයයන් 03 ක් සමත් වීම **සහ**
(iii) පරිගණක සාක්ෂරතාවය **සහ**
(iv) පිළිගත් විද්‍යාගාරයක වසර තුනක (03) විශ්ලේෂණ පළපුරුද්දක් ලබා තිබීම.
(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම.
ඉහත (i), (ii) හා (iii) සමගාමීව පුහුණුවන්නන් බඳවා ගැනේ.
තාක්ෂණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුරෙහි ස්ථිර සේවා නියුක්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යාසලාභී තාක්ෂණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන වසර 1 1/2 ක සේවාස්ථ පුහුණු කාල සීමාවක් (NVQ-5 මට්ටමට සමාන) සම්පූර්ණ කර තිබීම හා ලිඛිත පරීක්ෂණ වලින් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ.
(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

(10) තත්ත්ව පාලන සහකාර (MA 2-1 - III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික / වෘත්තිමය
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, සිංහල / දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් ඇතුළත්ව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් 06කින් එක්වරකදී සමත්ව සිටීම **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන්, (නව විෂය නිර්දේශයෙන්) (පොදු ප්‍රශ්න පත්‍රය හැර) රසායන විද්‍යාව විෂය ඇතුළුව සම්මාන සාමාර්ථයන් 02ක් සහිතව විද්‍යා විෂයයන් 03 කින් සමත්ව සිටීම **හෝ**
(iii) අ.පොස (උ/පෙළ) විභාගයෙන්, (පැරණි විෂය නිර්දේශයෙන්) රසායන විද්‍යාව විෂය ඇතුළුව විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විද්‍යා විෂයයන් 03 කින් සමත්ව සිටීම **සහ**
පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් ලෙස සැලකේ **සහ**
(iv) පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක වසර 02ක පළපුරුද්ද.
(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම
ඉහත (i), (ii) හා (iii) අවශ්‍යතා සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනේ.
තත්ත්ව පාලන සහකාරවරු ලෙස ස්ථිර කාර්ය මණ්ඩලයට එක්කර ගැනීම සඳහා පුහුණුවන තත්ත්ව පාලන සහකාර ලෙස වසර 1 1/2 ආයතන අභ්‍යන්තර පුහුණු කාලයක (NVQ 5 මට්ටමට සමාන) පළපුරුද්ද සමග ලිඛිත පරීක්ෂණයකට මුහුණ දීම අත්‍යවශ්‍ය කරුණු වේ.
(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

(II) ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන (MA 2-1 - III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, එකවරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) (නව විෂය නිර්දේශය) විද්‍යා ධාරාවේ විෂයයන් 02 කින් සමත්ව සිටීම **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විද්‍යා ධාරාවේ විෂයයන් 02 කින් සමත්ව සිටීම **සහ**
(iii) ස්ථිර සේවකයෙකු ලෙස ඖෂධ නිෂ්පාදනාගාරයක අවම වශයෙන් වසර 02ක නිෂ්පාදන කාර්ය පළපුරුද්ද.
(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම
ඉහත (i) හා (ii) අවශ්‍යතා සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනේ.
ස්ථිර ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස බඳවා ගැනීම සඳහා, පුහුණුවන ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස වසර 1 1/2 ආයතන අභ්‍යන්තර පුහුණු කාලයක (NVQ 5 මට්ටමට සමාන) පළපුරුද්ද සමග ලිඛිත පරීක්ෂණයකට මුහුණ දීම අත්‍යවශ්‍ය කරුණු වේ.
(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

(12) පොත් තබන්නා (MA 2-1-III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, එක්වරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම
සහ
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) (නව විෂය නිර්දේශය) විෂයයන් 02 කින් සමත්ව වීම (විද්‍යා හෝ වාණිජ විෂය ධාරාව සඳහා වැඩි සැලකිල්ලක් යොමුවේ) **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විෂයයන් 02 කින් සමත් වීම (විද්‍යා හෝ වාණිජ විෂය ධාරාව සඳහා වැඩි සැලකිල්ලක් යොමුවේ) **සහ**
(ආ) වෘත්තීමය
(i) ජාතික වෘත්තීය සුදුසුකම් NVQ-5 මට්ටමට නොඅඩු පරිපාලන ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම විභාගය **හෝ**
(ii) ජාතික වෘත්තීය සුදුසුකම් NVQ-5 මට්ටමට නොඅඩු පොත් තබන්නන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම **හෝ**
(iii) AAT අවසාන විභාගය සමත් වී තිබීම **හෝ**
(iv) පොත් තැබීමේ ක්ෂේත්‍රයට අදාළව NVQ-5 මට්ටමට නොඅඩු ඕනෑම වෙනත් සමාන සහතික පාඨමාලාවක් සමත් වී තිබීම **සහ**
(ඇ) පරිගණක සාක්ෂරතාවය **සහ**
(ඈ) රජයේ සංස්ථාවක /මණ්ඩලයක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක හෝ විගණන ආයතනයක පොත් තබන්නෙකු හෝ ගිණුම් ලිපිකරුවෙකු වශයෙන් අවම වශයෙන් වසර 3ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

සුදුසුකම් (7) සිට (12) දක්වා තනතුරු සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයෙකු වශයෙන්, ප්‍රාථමික ශ්‍රේණියේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු වර්ගීකරණයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව වෘත්තීය සුදුසුකම් සමග වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

තනතුරු (7) සිට (12) දක්වා පොදු කරුණු

- **වැටුප් පරිමාණය**
  MA 2-1–2016 රුපියල් 30,310/-10/-x300-7x-350-4x- 495-20x-660= 50,940/=
- **වයස**
  අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමය**
  ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

(I3) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1 -III ශ්‍රේණිය)

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික
(i) අ.පොස (සා/පෙළ) විභාගයෙන්, එක්වරකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම. **සහ**
(ii) අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) (නව විෂය නිර්දේශය) විෂයයන් 02 කින් සමත් වීම **හෝ**
අ.පොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විෂයයන් 02 කින් සමත් වීම **සහ**
(ආ) යතුරු ලියනයේ අවම වශයෙන් විනාඩියට වචන 35ක වේගයක් සහිතව පරිගණක සාක්ෂරතාවය **සහ**
(ඇ) රජයේ සංස්ථාවක /මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

සැලකිය යුතුය :

Microsoft Office හෝ Open Office පැකේජ සම්බන්ධයෙන් දක්ෂතාවය අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයෙකු වශයෙන්, ප්‍රාථමික ශ්‍රේණියේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු වර්ගීකරණයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව වෘත්තීය සුදුසුකම් සහිතව අදාළ පළපුරුද්ද ලබා ගැනීම සඳහා ස්ථිර තනතුරක වසර 05ක සාර්ථක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

තනතුරු (13) සඳහා පොදු කරුණු

- **වැටුප් පරිමාණය**
  MA 1-1 – 2016 රුපියල් 27,910/- 10x300 - 7x350- 4x495- 20x660 = 48,540/=
- **වයස**
  අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවාගැනීමේ ක්‍රමය**
  ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ආන්තික ප්‍රතිලාභ :

- පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා.
- උපයෝගීකර නොගත් වාර්ෂික හා වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය.
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හා වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය.
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක්ද , සේවකයා 10% ක්ද වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම.
- සංස්ථාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වැටුපෙන් 3% ක් වශයෙන් දායක වනු ඇත.

පොදු උපදෙස් :

- නියමිත ආකෘති පත්‍රවල සකසන ලද අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා විමසුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්, අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. අදාළ අයදුම්පත ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන **http://www.spmclanka.lk** වෙතින් බාගත (Download) කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළයුතු අතර, ආයතන ප්‍රධානී විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළවී දින 10ක් ඇතුළත, පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.
- ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත, රත්මලාන

Source: www.spmclanka.lk (2020.09.21)